මගේ අංකය - ඩී14/ හෙද බඳවා ගැනීම -2026
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09,
2026.03. ෆ

මූලස්ථාන අධිකාරි , සියළුම බන්ධනාගාර අධිකාරීන් සහ,
සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත

<u>බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ හෙද නිලධාරී (III ශ්‍රේණිය) තනතුර සඳහා සීමිත ධාරාව යටතේ බඳවා ගැනීම - 2026</u>

මෙම දෙපාර්තමේන්තුවේ හෙද නිලධාරී (පිරිමි) තනතුරේ පුරප්පාඩු 08 ක් පිරවීම සඳහා පහත දක්වා ඇති කායික හා අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර ඇති බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. ඒ අනුව, මෙයට අමුණා ඇති ආකෘති පත්‍රයට අනුකූලව සකස් කර ගන්නා ලද අයදුම්පත් සම්පූර්ණ කර පිටපත් දෙකකින් යුක්තව 2026.03.31 දිනට ප්‍රථම බන්ධනාගාර මූලස්ථානයේ ආයතන අංශය වෙත එවිය යුතුය. **අවශ්‍ය සුදුසුකම් නොමැති අයදුම්කරුවන්, නියමිත ලෙස අයදුම්පත සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් සහ ප්‍රමාද වී ඉදිරිපත් කරන ලද අයදුම්පත් කිසිදු පූර්ව දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

03. වැටුප්

3.1 වැටුප් කේත අංකය : MT 7 - 2025

3.2 වැටුප් ක්‍රමය : රු. 54,920 -10 x 800 – 11 x 1,190 – 10 x 1,320– 10 x 1,350 – 102, 710

3.3 පුහුණු කාලය : රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 අනුව පුහුණු කාල සීමාව සඳහා එහි උපලේඛන VI සඳහන් පරිදි ගෙවීම් කටයුතු සිදුකරනු ලැබේ.

04. **තනතුරෙහි ස්වභාවය**
ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරකි.

05. **බඳවා ගැනීමේ සුදුසුකම්:**

අ.

i. බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ස්ථිර තනතුරක් දරණ නිලධාරියෙකු විය යුතුය.
ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
iii. සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අන් සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතුය.
iv. අවම උස අඩි 05 අඟල් 04 – 162.5 cm
v. අයදුම්කරුවන් සඳහා පපුව හුස්ම නාල්ලා අඟල් 32ක් විය යුතුය.

ආ. අධ්‍යාපන සුදුසුකම් :

අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී විද්‍යා විෂය ධාරාවට අයත් ජීව විද්‍යාව/ගණිතය/කෘෂි විද්‍යාව/විෂය ධාරාවෙන් සියලුම විෂයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වීම, පැරණි විෂය නිර්දේශය යටතේ විෂයන් තුනකින් එකවර සමත් වීම.

සහ

සිංහල/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි යන විෂයන් හතර (4)කට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් හය(6) කින් අ.පො.ස.(සා.පෙළ) විභාගය සමත්ව තිබීම.

ඇ. සුදුසුකම් පිළිබඳ සීමාවන්

i. මෙම තනතුර සඳහා අයදුම්කිරීමට අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර වන විට සෑම අයුරකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

ii. ඉහත 5 (අ) හි සඳහන් සුදුසුකම් තනතුරට බඳවා ගන්නා තෙක් පැවතිය යුතුය.

iii. සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා අදාළ සහතිකවල පිටපත් අයදුම්පත්‍රය සමඟ අමුණා ඉදිරිපත් කළ යුතුය. (අ.පො.ස (සා.පෙළ) හා (උ/පෙළ) විභාග සඳහා විභාග දෙපාර්තමේන්තුවෙන් ලබාගත් විභාග සහතිකවල පිටපත් ඉදිරිපත් කල යුතුය.)

06. **වයස් සීමාව** : අදාළ නොවේ.

07. **බඳවා ගැනීමේ ක්‍රමය** : බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ දැනුම්දීම මත සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් මගින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් වෙත යොමු කර පුරප්පාඩු සංඛ්‍යාව අනුව ඉහළම සුදුසුකම් සපුරාලනු ලබන අයදුම්කරුවන් තෝරාගනු ලැබේ.

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්(වැ.බ.)

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (වැ.බ.)
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

## බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ වෛද්‍ය නිලධාරී තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම් පත්‍රය - 2026

1. මුලකුරු සමඟ නම :................................................................................................

2. සම්පූර්ණ නම :....................................................................................................
................................................................................................................

3. උපන් දිනය :.......................................................................................................

4. ජාතික හැඳුනුම්පත් අංකය :.....................................................................................

5. ස්ථිර ලිපිනය :.....................................................................................................

6. දැනට දරණ තනතුර :..............................................................................................

7. සේවය කරනු ලබන ආයතනය :.................................................................................

8. වෘත්තියට අදාළව යම්කිසි පාඨමාලා හදාරා ඇත්නම් ඒ පිළිබඳ විස්තර :

   i. ........................................................
   ii. ........................................................
   iii. ........................................................

9. අධ්‍යාපන සුදුසුකම් :

9.1 අ.පො.ස. ( උසස් පෙළ ) විභාගය

විභාග අංකය :- වර්ෂය :-

| අනු අංකය | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

9.2 අ.පො.ස. ( සාමාන්‍ය පෙළ ) විභාගය

i. විභාග අංකය :- වර්ෂය :-

| අනු අංකය | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

ii. විභාග අංකය :- වර්ෂය :-

| අනු අංකය | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

**10.** පසුගිය පස් වසර තුළ අවවාද කිරීමකට වැඩි දඬුවමක් ලබා තිබේද යන වග :-...........................................

i. දඬුවම් ලබා දී තිබේ නම් විනය නියෝගය නිකුත්කල ලිපියේ අංකය සහ දිනය :
..................................................................................................................................

**11.** විසඳීමට විනය පරීක්ෂණ තිබේද යන වග, එසේනම් විස්තර :-.................................................
..................................................................................................................................

ඉහත සදහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, හෙද පුහුණුව සඳහා තෝරා ගනු ලැබුවහොත් එම අවස්ථාවේ පුරප්පාඩු පවතින ඕනෑම බන්ධනාගාර ආයතනයක සේවය කිරීමට කැමති/ අකමැති බවත්, මෙයින් සහතික කරමි.

දිනය :- ............................... ......................................

අයදුම්කරුගේ අත්සන

බන්ධනාගාර අධිකාරි නිර්දේශය :-

.................................................................................... වන මෙම නිලධාරියා මෙම ආයතනයේ සේවය කරන බවත්, ඔහුගේ වැඩ, පැමිණීම සතුටුදායක බවත්, අවවාද කිරීමකට වැඩි දඬුවමක් ලබා ඇති / නැති බවත්, විසඳීමට විනය පරීක්ෂණ ඇති / නැති බවත් සහතික කරන අතර, නිලධාරියාගේ අයදුම්පත නිර්දේශ කරමි / නොකරමි.

දිනය :- ............................................ ......................................

බන්ධනාගාර අධිකාරි